2023

වාහන වායු විමෝචන භාරකාර අරමුදල
வாகன புகை பரிசோதனை நிகழ்ச்சித் திட்டம்
VEHICULAR EMISSION TEST TRUST FUND
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
மோட்டார் வாகன போக்குவரத்துத் திணைக்களம்
DEPARTMENT OF MOTOR TRAFFIC

# වාර්ෂික කාර්යය සාධන වාර්තාව

වාහන වායු විමෝචන වැඩසටහන
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 341, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,
කොළඹ 05.

**හදිසි ඇමතුම් අංක** **:011-3100152/ 070-3500525 (viber/Whatsapp)**
**ෆැක්ස්අංක** **:011-2669915**
**ඊ-මෙල්** **:dmtvet@gmail.com**
**වෙබ් අඩවිය** **:www.vet.lk**

# වාහන වායු විමෝචන භාරකාර අරමුදල

# කාර්යය සාධන වාර්තාව - 2023

# පටුන

**පිටු අංකය**


**1. පරිච්ඡේදය**

1.1. හැඳින්වීම 4
1.2. වාහන වායු විමෝචන භාරකාර අරමුදල හා භාරකාර මණ්ඩලය 5
1.3. වාහන වායු විමෝචන භාරකාර අරමුදලෙහි දැක්ම / මෙහෙවර / අරමුණු 6
1.4. සහයෝගය දක්වන ආයතන හා දායකත්වය 7-8
1.5. වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය 9-10
1.6. වාහන වායු විමෝචන අංශයෙහි උපාය මාර්ග 11

**2. පරිච්ඡේදය**

2.1. කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වාහන වායු විමෝචන මධ්‍යස්ථාන පරීක්ෂාව හා අධීක්ෂණය 12-15
2.2. මාර්ගස්ථ වාහන පරීක්ෂාව 16-17
2.3. අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනා ගැනීමේ වැඩසටහන 18-19
2.4. මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ෂණය 20
2.5. පසු විපරම් පරීක්ෂාව 21
2.6. ත්‍රිවිධ හමුදා වාහන වල දුම් පරීක්ෂාව 22
2.7. වාහන වායු විමෝචන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම, ප්‍රදර්ශන හා වැඩමුලු සංවිධානය 23-27
2.8. යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම,පර්යේෂණ සහ සංවර්ධනය තුළින් වාහන වායු විමෝචන වැඩසටහනේ අපේක්ෂිත සඵලතාව වැඩි දියුණු කිරීම. 28
2.9. අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබා දීම 29
2.10. පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිත කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම. 30

**3. පරිච්ඡේදය**

3.1. 2023 වර්ෂයේ වාහන ගණත්වය 31
3.2. 2023 වර්ෂයේ වාහන වායු විමෝචන මධ්‍යස්ථාන දෙක මගින් සිදු කළ දුම් පරීක්ෂාණ වල සාරාංශය 32-34

**4. පරිච්ඡේදය**

4.1. 2023 වර්ෂයේ දුම් පරීක්ෂණ මගින් 10%ක මුදල් ලැබීම් 35
4.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 36
4.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 37
4.4. ස්ථාවර වත්කම් වෙනස් වීම් හා ක්ෂය 38
4.5. ස්ථාවර තැන්පතු සහ පොලී ආදායම් 39

**5. පරිච්ඡේදය**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 40
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 41

# 01- පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

වාහන වලින් පිටවන දූෂ්‍යකාරක නිසා නාගරික ප්‍රදේශයන් තුල වාහන වායු දූෂණය සිදුවන බවත් එමගින් පුරවැසියන්ට හුස්ම ගැනීමට පිරිසුදු වාතය නොමැතිවීම නිසා මානව හිමිකම් කඩවන බවත් සඳහන් කර වාහන සඳහා වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලෙස ඉල්ලා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 569/98 දරණ පෙත්සම ගොනු කරන ලදී. එම පෙත්සම පංච පුද්ගල විනිසුරු මණ්ඩලයක් විසින් 1999 වර්ෂයේ විභාග කරන ලද අතර වාහන වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලදී.

ඒ අනුව 2000 වර්ෂයේදී වාහන වලට වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලද අතර එම නියෝගවල වායු විමෝචන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා නම් කරන ලදී. ඉන් අනතුරුව මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා මූලික සාකච්ඡා සියළුම පාර්ශවකරුවන් සමග පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයන්හිදී පවත්වන ලද අතර එම සාකච්ඡා වලදී ගත් තීරණ අනුව භාවිතා කරන වාහන වල ප්‍රමිතිය පරික්ෂා කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වූ අතර එහිදී විශාල ලෙස වාහන අසමත් වූ හෙයින් ආරම්භයේදීම මෙම වැඩසටහනට මහජනතාවගෙන් විරෝධතාවයන් මතු වීම වළක්වාලීම සඳහා 2003 නව ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව 2008 වර්ෂයේ නොවැම්බර් 17 වන දින මෙම වැඩසටහන බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කර ඇති අතර මේ වන විට සියළුම පලාත් වල ක්‍රියාත්මක කර ඇත.

2008 ජනවාරි මස 25 දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අති විශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක1557/14 ජාතික පරිසර (වායු විමොචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

ලියාපදිංචි වන අධික වාහන සංඛ්‍යාව හේතුවෙන් නාගරික හා අර්ධ නාගරික පෙදෙස් තුළ ඇතිවන වායු දූෂණය අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන වාහන වායු විමෝචන නියාමන වැඩසටහන් තව දුරටත් සවිබල ගන්වා ඇත.

## 1.2 වාහන වායු විමෝචන භාරකාර අරමුදල හා භාරකාර මණ්ඩලය

- අමප/08/1514/358/054 හා 2008.09.03 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල පිහිටුවන ලදී.
- එසේම වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩලයක් ස්ථාපිත කිරීමටත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමට හා ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමටත් , පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රයේ උපදෙස් ලබා ගැනීමටත්, ව්‍යාපෘති කාර්යාලය උප දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමටත් කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.
- භාරකාර ගිවිසුම 2009.12.27 දින භාණ්ඩාගාර ලේකම් හා භාරකාර මණ්ඩලය අතර අත්සන් කරන ලදි.
- පළමු භාරකාර රැස්වීම 2010.03.26 වන දින  පවත්වන ලද අතර ව්‍යාපෘති කාර්යාලය ස්ථාපිත කිරීමටත් ව්‍යාපෘති කාර්යය මණ්ඩලය බඳවා ගැනීමටත් අනුමැතිය ලබා දෙන ලදි.
- ඒ අනුව 2011 සිට වායු විමෝචන කාර්යයාලය ආරම්භ කර වාහන වායු විමෝචන කාර්යයන් සිදු කරනු ලබයි.

### 2023 වර්ෂයේ වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩලය

- නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් - මුදල් අමාත්‍යංශය (සභාපති)
  ඩබ්.ඒ.සරත් කුමාර මහතා

- ලේකම් - ප්‍රවාහන අමාත්‍යංශය
  එම්.එම්.පී.කේ මායාදුන්න මහතා

- ලේකම් - පරිසර අමාත්‍යංශය
  වෛද්‍ය අනිල් ජාසිංහ මහතා

- මුදල් අමාත්‍යාංශයේ නියෝජිත
  ආර්.ඒ.එස්.කේ.රණසිංහ මහතා (2023. මාර්තු දක්වා)
  එස් ජලදීපන් මිය (2023 දෙසැම්බර් දක්වා)

- කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
  එන්.ඒ.වීරසිංහ මහතා

## 1.3 වාහන වායු විමෝචන භාරකාර අරමුදලෙහි දැක්ම / මෙහෙවර / අරමුණු




වායු විමෝචන වැඩසටහන 2008 වර්ෂයේ ආරම්භ කිරීමෙන් අනතුරුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා විගණනය කිරීම් සම්බන්ධයෙන් සියළුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය මත සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්, පරිසර අමාත්‍යංශයේ ලේකම්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් යන සමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් පත්කර මුදල් අමාත්‍යාංශ ලේකම් හා භාරකාර මණ්ඩල සමග අරමුදල් ගිවිසුම් ඔප්පුවක් (Deed of Trust) අත්සන් කර මෙම භාරකාර අරමුදල පහත සඳහන් අරමුණු 07 ක් සඳහා පිහිටුවා ඇත.

1. වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ කාර්යයන් පහසු කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුල ව්‍යාපෘති කාර්යාලය ආරම්භ කර පවත්වා ගෙන යාම.

2. එම කාර්යාලය මගින් කාර්යක්ෂම හා නිසි ප්‍රමිතීන් පවත්වා ගෙනයාම සඳහා අධීක්ෂණ හා ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක කර අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම.

3. මෙම වැඩසටහන අධික්ෂණය හා ඇගයීම් කටයුතු සඳහා අවශ්‍ය කරන පර්යේෂණ හා විශ්ලේෂණ සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම.

4. සම්පත්දායකවරුන්, උපදේශකවරුන්, ගණකාධිකාරි හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීම.

5. වායු විමෝචන වැඩසටහන කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

6. වාහන කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම වැඩිදියුණු කිරීම හා මාර්ග ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් ලබාදී අරමුණු ඉටුකර ගැනීම.

7. වායු දූෂණය අඩු කර වායු තත්වය වැඩිදියුණු කිරීමටත්, රෝග ඇතිවීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගෙන මහජනතාවගේ සාමාන්‍ය ජනජීවිතය නගා සිටුවීම.

## 1.4 සහයෝගය දක්වන ආයතන හා දායකත්වය

- ❖ වායු විමෝචන භාරකාර අරමුදල
  - වාහන දුම් පරීක්ෂණ සිදුකරන ලාෆ්ස් ඉකො ශ්‍රී ආයතනය (Laugfs Eco Sri) සහ ද්‍රයිව් ග්‍රීන් ආයතනය (Drive Green) කළමනාකරණය හා නියාමනය.
  - වාහන දුම් පරීක්ෂණ කටයුතු සිදුකිරීම.(මාර්ගස්ථ හා ස්ථානීය වශයෙන්)
  - දුම් පරීක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රවර්ධන කටයුතු
  - දුම් පරීක්ෂණ ගාස්තුවෙන් 10%ක් අරමුදල වෙත රැස් කිරීම හා විගණනය
  - වායු තත්ව කළමනාකරණය වෙනුවෙන් කටයුතු කරන ආයතන සමග සම්බන්ධිකරණය කිරීම හා අරමුදලේ අරමුණු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදා හැරීම සහ ප්‍රගතිය පරීක්ෂාව

- ❖ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.
  - වායු විමෝචන පරීක්ෂණ ව්‍යාපෘති කාර්යාලය ස්ථාපිත කර අවශ්‍යතාව මත දෙපාර්තමේන්තු සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම.
  - මොටර් රථ පනත ප්‍රකාරව වාහන දුම් පරීක්ෂණ අධීක්ෂණ කටයුතු සිදුකිරීම (මෝටර් රථ පරීක්ෂකවරු සම්බන්ධීකරණය)
  - දුම් පරීක්ෂණ සිදුකරන ආයතන සහ රජය සමග ඇති කරගෙන ඇති ගිවිසුම සම්බන්ධ නීතිමය කටයුතු සඳහා දායක වීම.

- ❖ ප්‍රවාහන අමාත්‍යාංශය
  - නීති හා අමාත්‍ය මණ්ඩල සම්බන්ධිකරණය

- ❖ පරිසර අමාත්‍යංශය
  - වාහන දුම් පිලිබඳ අණ පනත් සෑදීම හා සංශෝධනය.
  - වායු සම්පත් කළමනාකරණයේ පාර්ශවකරුවන් රැස්කිරීම හා සම්බන්ධීකරණය

- ❖ මධ්‍යම පරිසර අධිකාරිය
  - දුම්පරීක්ෂණ මධ්‍යස්ථාන ඇතිකිරීමට අනුමැතිය ලබා දීම, පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම.
  - අහඹු වාහන දුම් පරීක්ෂන කටයුතු සඳහා සහය වීම (මාර්ගස්ථ හා ස්ථානීය වශයෙන්)
  - මධ්‍යස්ථාන විගණන කටයුතු සිදු කිරීම.
  - සංසරණ වායු තත්වයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම සහ ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය

- ❖ මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
  - දුම් පරීක්ෂණ ක්‍රමවේදය , උපකරණ අනුමත කිරීම, ප්‍රතීතනය හා සම්මතයන් සැකසීම.
  - දුම් පරීක්ෂණ උපකරණ වාර්ෂිකව ක්‍රමාංකනය කිරීම.
  - මධ්‍යස්ථාන පරීක්ෂණ අධීක්‍ෂණ කටයුතු සඳහා සහභාගී වීම
- ❖ සෞඛ්‍ය අමාත්‍යාංශය
  - වායු දූෂණයට අදාළ සෞඛ්‍ය බලපෑම් සඳහා ප්‍රතිපත්තිමය තීරණය නිරීක්ෂණය කිරීමේ වගකීම දරයි.
  - වාහන විමෝචනය සම්බන්ධ සෞඛ්‍ය බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම.

- ❖ ශ්‍රි ලංකා පොලීසිය
  - රජය විසින් සකසා ඇති වායු තත්ත්ව ප්‍රමිතිය ඵලදායී ලෙස මාර්ගයේදී බලාත්මක කිරීම .

- ❖ ලාෆ් ඉකෝ ශ්‍රි සහ ක්ලින්කෝ ලංකා කොන්ත්‍රාත් ආයතන


- VET මධ්‍යස්ථාන, උපකරණ සහ අනෙකුත් පහසුකම් සඳහා ආයෝජනය කර විමෝචන පරීක්ෂණය සිදු කිරීමට සහ දිවයින පුරා VET සහතික නිකුත් කිරීම

❖ මොරටුව විශ්ව විද්‍යාලය
- වායු තත්වයේ ගුණාත්මකභාවය පවත්වගෙන යාම සඳහා උපදෙස් ලබා දීම.


❖ ශ්‍රී ලංකා ප්‍රමිතන මණ්ඩලය
- වායු තත්වයේ ගුණාත්මකභාවය පවත්වගෙන යාම සඳහා උපදෙස් ලබා දීම

## 1.5 වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය

වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය මඟින් සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු හා ඒ ආශ්‍රිතව ආයතන කටයුතු සිදුකිරීම, මෙම අංශය මඟින් ඉටු වේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යංශයත්, මධ්‍යම පරිසර අධිකාරියත්, රජයේ කිරුම් මිනුම් දෙපාර්තමේන්තුවත් සම්බන්ධීකරණය කර ගනිමින් අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය මඟින් සිදුකෙරේ. වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1143/VETF දරණ හා 2017.12.10 දිනැති ලිපිය මගින් අනුමත කාර්යය මණ්ඩලය 47කි.



## 1.5.1 පවතින සංවිධාන ව්‍යුහය




- *දෙපාර්තමේන්තු නිලධාරීන් (පූර්ණකාලීන -04, වැඩබලන -02)
- කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති නිලධාරීන් 16

## 1.6. වාහන වායු විමෝචන අංශයෙහි උපාය මාර්ග

*අධීක්ෂණය*

- කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන VET මධ්‍යස්ථාන පරීක්ෂව සහ අධීක්ෂණ වැඩසටහන
- මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන. (Road Side Testing)
- අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හදුනාගැනීම සඳහා ඡායරූප ලබාගැනීමේ Spotter වැඩසටහන
- මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන මගින් අසමත් වන හා අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හදුනාගැනීමේ වැඩසටහන මගින් හදුනා ගන්නා වාහන පසු විපරම් පරීක්ෂා කිරීමේ වැඩසටහන
- ත්‍රිවිධ හමුදා වාහන පරීක්ෂාව සහ අධීක්ෂණ වැඩසටහන

*ප්‍රවර්ධනය*

- VET වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන, වැඩමුලු සංවිධානය.
- තාක්ෂණික සහාය ශක්තිමත් කිරීම සඳහා නිසි වාහන අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් - කාර්මික ශිල්පීන් / ගරාජ් හිමියන් පුහුණු කිරීම යනාදිය.
- යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ සංවර්ධනය තුළින් VET වැඩසටහනේ අපේක්ෂිත සපලතාව වැඩි දියුණු කිරීම.
- අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබාදීම

*නියාමනය*


- පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම.

## 02- පරිච්ඡේදය

## 2.1 කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වාහන වායු විමෝචන මධ්‍යස්ථාන පරීක්ෂාව හා අධීක්ෂණය

වායු විමෝචන පරීක්ෂණ කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කාර සමාගම් විසින් දිවයින පුරා පවත්වා ගෙන යනු ලබන පරීක්ෂණ මධ්‍යස්ථාන අපගේ කාර්යාලයේ නිලධාරීන් විසින් වරින් වර පරීක්ෂාවට ලක් කරනු ලබයි. එහිදී යෝජනා කැඳවීමේ ලියවිල්ලට අනුව හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබා දී ඇති උපදෙස් අනුව මධ්‍යස්ථාන පවත්වා ගෙන යන්නේද සහ නියමිත ප්‍රමිතියෙන් යුතුව පරීක්ෂණ සිදු කරන්නේ ද පිළිබඳව සොයා බැලීම සිදු කරනු ලබයි. එසේ නියමිත ප්‍රමිතින් හා උපදෙස් අනුව ක්‍රියා නොකරන මධ්‍යස්ථාන නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, තාවකාලිකව හෝ ස්ථිරව වසා දැමීමට ක්‍රියා කරනු ඇත.

**Center inspection program (Auditing & Monitoring of VET centers)**




2023 වර්ෂය වන විට ක්ලින්කෝ ලංකා හා ලාෆ් ඉකෝ ශ්‍රී ආයතන දෙක මගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන අංශයේ නියාමනය යටතේ මධ්‍යස්ථාන 464ක දුම් පරීක්ෂණ කටයුතු සිදු කරන

අතර එම මධ්‍යස්ථාන සත්‍යායනය කිරීම සඳහා වාහන වායු විමෝචන අංශයේ නිළධාරීන් හා මෝටර් රථ පරීක්ෂකවරුන් ඇතුලත් කණ්ඩායමක් කටයුතු කරයි.

| මධ්‍යස්ථාන වර්ගය | ස්ථිර / අර්ධ ස්ථිර | ජංගම | එකතුව |
|---|---|---|---|
| ක්ලීන්කෝ්ලංකා | 98 | 129 | 227 |
| ලාෆ් ඉකෝ ශ්‍රී | 95 | 142 | 237 |
| **මුළු මධ්‍යස්ථාන ගණන** | **192** | **273** | **464** |

එම දුම් පරීක්ෂන මධ්‍යස්ථාන 464 දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් පහත පරිදි ව්‍යාප්තව පරීක්ෂණ කටයුතු සිදු කරයි.

| දිස්ත්‍රික්කය | ස්ථිර | අර්ධ ස්ථිර | ජංගම | එකතුව |
|---|---|---|---|---|
| අම්පාර | 0 | 7 | 17 | 24 |
| අනුරාධපුර | 1 | 7 | 25 | 33 |
| බදුල්ල | 0 | 7 | 12 | 19 |
| මඩකලපුව | 0 | 2 | 8 | 10 |
| කොළඹ | 7 | 24 | 0 | 31 |
| ගාල්ල | 3 | 6 | 15 | 24 |
| ගම්පහ | 6 | 21 | 1 | 28 |
| හම්බන්තොට | 1 | 5 | 8 | 14 |
| යාපනය | 0 | 6 | 9 | 15 |
| කලුතර | 2 | 9 | 12 | 23 |
| නුවර | 2 | 6 | 14 | 22 |
| කෑගල්ල | 1 | 7 | 7 | 15 |
| කිළිනොච්චි | 0 | 2 | 0 | 2 |
| කුරුණෑගල | 2 | 16 | 34 | 52 |
| මන්නාරම | 0 | 1 | 1 | 2 |
| මාතලේ | 1 | 4 | 10 | 15 |
| මාතර | 2 | 3 | 15 | 20 |
| මොනරාගල | 0 | 3 | 18 | 21 |
| මුලතිව් | 0 | 0 | 7 | 7 |
| නුවර එළිය | 0 | 4 | 5 | 9 |
| පොලොන්නරුව | 1 | 2 | 13 | 16 |
| පුත්තලම | 0 | 8 | 14 | 22 |
| රත්නපුර | 1 | 9 | 14 | 24 |
| ත්‍රිකුණාමලය | 0 | 2 | 11 | 13 |
| වව්නියාව | 0 | 2 | 1 | 3 |
| **එකතුව** | **30** | **163** | **271** | **464** |

එසේම 2023 වර්ෂයේ දී රට පුරා මධ්‍යස්ථාන 142ක් පරීක්ෂා කළ අතර එහි තත්ත්ව පරීක්ෂාවට අනුව ප්‍රමිතියෙන් තොරව පවත්වාගෙන යන මධ්‍යස්ථාන 02ක මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කර විමර්ශන කටයුතු සිදු කරන ලදි. ත්‍රිකුණාමලය,පොළොන්නරුව, හම්බන්තොට, අම්පාර, මාතර, කුරුණෑගල, ගාල්ල, අනුරාධපුර,


කොළඹ, බදුල්ල, කෑගල්ල, රත්නපුර, නුවර, මීගමුව යන දිස්ත්‍රික්කයන් වල මධ්‍යස්ථාන සඳහා ඉඩම් පරීක්ෂාවන් 73ක් 2023 වර්ෂය තුළ දී සිදු කර ඇත.

## 2023 වර්ෂය තුළ දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණ සාරාංශය

| මාසය | ලාෆ් ඉකෝ ශ්‍රී මධ්‍යස්ථාන | ක්ලීන්කෝ ලංකා මධ්‍යස්ථාන |
|---|---|---|
| ජනවාරි | 00 | 00 |
| පෙබරවාරි | 0 | 0 |
| මාර්තු | 06 | 08 |
| අප්‍රේල් | 05 | 07 |
| මැයි | 12 | 11 |
| ජූනි | 02 | 02 |
| ජූලි | 09 | 08 |
| අගොස්තු | 11 | 08 |
| සැප්තැම්බර් | 04 | 08 |
| ඔක්තෝබර් | 18 | 11 |
| නොවැම්බර් | 07 | 03 |
| දෙසැම්බර් | 01 | 01 |





Network: 29 Aug 2023 10:42:47 GMT+05:30
Local: 29 Aug 2023 10:42:48 GMT+05:30
6°52'0.558"N 79°54'38.772"E
330 Old Kottawa Road
Mirihana
Nugegoda
Colombo
Western Province


LAUGFS
ECO SRI
Colombo
Western Province


Trincomalee Highway
Oddamavadi
Batticaloa
Eastern Province

## 2.2 මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන

මෙම වැඩසටහන මගින් මාර්ගයේ ධාවනය කරනු ලබන අහඹු ලෙස තෝරා ගෙන  එම අවස්ථාවේම නවතා වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල ද යන්න පරීක්ෂා කරනු ලබන අතර මේ සඳහා පොලිස් නිලධාරීන්ගේ සහය ලබා ගනු ලබයි.



2023 වර්ෂයේදී මාර්ගයේ ධාවනය වන වාහන වලින් අහඹු ලෙස වාහන 5437ක් පරීක්ෂාවට ලක් කළ අතර පරීක්ෂාවට ලක් කළ වාහන වලින් දුම් පරීක්ෂණය අසමත් වාහන වල ප්‍රතිශතය 35% කි. පරීක්ෂා කළ එම වාහන වල දුම් පරීක්ෂණය සමත්, අසමත් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| මාසය | පරීක්ෂාවට ලක් කළ වාහන සංඛ්‍යාව | සමත් ප්‍රමාණය | අසමත් ප්‍රමාණය |
|---|---|---|---|
| ජනවාරි | 00 | 00 | 00 |
| පෙබරවාරි | 687 | 470 | 217 |
| මාර්තු | 561 | 327 | 234 |
| අප්‍රේල් | 127 | 62 | 65 |
| මැයි | 624 | 303 | 321 |
| ජූනි | 79 | 44 | 35 |
| ජූලි | 571 | 345 | 226 |
| අගෝස්තු | 907 | 623 | 284 |
| සැප්තැම්බර් | 652 | 452 | 200 |
| ඔක්තෝබර් | 855 | 609 | 246 |
| නොවැම්බර් | 374 | 265 | 109 |
| දෙසැම්බර් | 00 | 00 | 00 |
| එකතුව | 5437 | 3500 | 1937 |










## 2.3 අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනා ගැනීමේ වැඩසටහන

මෙම වැඩසටහන මගින් මාර්ගයේ අධික ලෙස දුම් නිකුත් කරනු ලබන වාහන ඡයාරූප ගත කරනු ලබන අතර ඉන් අනතුරුව අදාල වාහන හිමියන් හඳුනා ගෙන ඔවුන්ට පරික්ෂා කිරීම සඳහා ස්ථානය තෝරා ගෙන දන්වා යැවීම සිදු කරනු ලබයි. එසේ දැනුම් දෙන වාහන නිසි ප්‍රමිතියෙන් ඇද්ද යන්න සම්බන්ධයෙන් පරික්ෂා කිරීම සිදු කරනු ලබයි.




2023 වර්ෂයේ දී මාර්ගයේ අධික ලෙස දුම් නිකුත් කරනු ලබන වාහන ඡයාරූප ගත කර පරීක්ෂාවට ලක් කල වාහන සංඛ්‍යාව පහත පරිදි වේ.

| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | 00 | 00 | 00 | 100 | 30 | 258 | 86 | 28 | 19 | 242 | 144 | 00 |













## 2.4 මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ෂණය

අධික කළු දුම පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන වල තොරතුරු අපගේ සමාජ මාධ්‍ය ජාල අංකය වෙත WhatsApp , Viber තාක්ෂණය මගින් මහජනතාව විසින් යොමු කරනු ලබයි. එම පැමිණිලි වලට අදාළ වාහනය පිළිබඳ තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියෙන් ලබා ගෙන වාහන හිමිකරුට ලිපි නිකුත් කරනු ලබයි. ඒ අනුව වාහන හිමිකරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර කාර්යාලයට හෝ මේ වන විට අප විසින් දුම් පරීක්ෂණ උපකරණ ලබා දී අනුමැතිය ලබා දී ඇති දිස්ත්‍රික් මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු කාර්යලයකට හෝ ඉදිරපත් කර දුම් පරීක්ෂණ කටයුතු සිදු කර ගත යුතුය.




ඒ අනුව 2023 වර්ෂයේ අප කාර්යාලය වෙත කළු දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පහත පරිදි වේ.

| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | 00 | 00 | 107 | 125 | 128 | 45 | 74 | 126 | 127 | 222 | 190 | 100 |

තවද මහජනතාව විසින් දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිලිබඳ පැමිණිලිද අප වෙත ඉදිරිපත් කරන අතර ඒ අනුව 2023 වර්ෂයේ දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිළිබඳ පැමිණිලි 03ක් ලැබී ඇති අතර ඒ පිළිබඳව විමර්ශන කටයුතු සිදු කර අදාළ විනය ක්‍රියා මාර්ග නිකුත් කර ඇත.

## 2.5 පසු විපරම් පරීක්ෂාව

මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන ( Road Side Testing) මගින් අසමත්වන වාහන හා අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හදුනාගැනීම සදහා ඡායරූප ලබාගැනීමේ (Spotter) වැඩසටහන මගින් හදුනා ගන්නා වාහන මෙන්ම අධික කළු දුම පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන පිළිබඳ මහජනතාව විසින් අප වෙත යොමු කරන පැමිණිලි වලට අදාල වාහන ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර කාර්යාලයට රැගෙනවිත් අපගේ තාක්ෂණික ශිල්පීන් වෙතින් පරීක්ෂා කරගත යුතුය.

<u>2023 වර්ෂයේදී එවැනි පරීක්ෂා කිරීම් සිදු කළ අතර පරීක්ෂා කළ වාහන සංඛ්‍යාව පහත පරිදි වේ</u>

| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | 06 | 34 | 103 | 180 | 147 | 215 | 211 | 196 | 264 | 173 | 333 | 122 |









## 2.6 යුධ හමුදා හා ගුවන් හමුදා වාහන පරීක්ෂාව සහ අධීක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාවට අයත් සාමාන්‍ය දුම් පරීක්ෂණ ක්‍රියාවලිය යටතේ මධ්‍යස්ථාන තුලින් දුම් පරීක්ෂාවන් සිදු නොකරන වාහන වායු විමෝචන අංශයේ තාක්ෂණික ශිල්පීන් විසින් අයකිරීමකින් තොරව පරීක්ෂාවටට ලක් කරනු ලබයි.

<u>2023 වර්ෂයේදී එවැනි පරීක්ෂා කිරීම් සිදු කළ අතර පරීක්ෂා කළ වාහන සංඛ්‍යාව පහත පරිදි වේ</u>

| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | - | - | 84 | 92 | 516 | 0 | 0 | 25 | 471 | 0 | 806 | 1215 |








## 2.7 වාහන වායු විමෝචන වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන, වැඩමුළු සංවිධානය

වාහන වායු විමෝචන වැඩසටහන මගින් වාහන වායු විමෝචන වැඩසටහන පිළිබදව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරනු ලබයි. වායු තත්වය හා වාහන වායු දූෂණයෙන් පරිසරයට ඇතිවන බලපෑම පිලිබදව, සෞඛ්‍යට ඇතිවන බලපෑම, වාහන වායු විමෝචන වැඩසටහන පිලිබදව , ප්‍රයෝගිකව වාහන පරීක්ෂණයට ලක් කිරීම හා වාහන නිසි පරිදි නඩත්තු කිරීම වැනි කරුණු පිළිබදව විවිධ පාර්ශවයන් සම්බන්ධ කරමින් දැනුවත් කිරීමේ වැඩමුළු සිදුකරන ලදී. මීට අමතරව අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම, රූපවාහිනී දැන්වීම් මගින්ද දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

| අනු අංකය | දැනුවත් කිරීමේ වැඩසටහන | වැඩමුළුව පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සදහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සදහා පුහුනු කිරීම. (මහනුවර) | 2/7/2023 | 102 |
| 2 | මාධ්‍ය නිලධාරීන්ව දැනුවත් කිරීම. | 2/14/2023 | 59 |
| 3 | දීප ව්‍යාප්ත රථ වාහන පොලිස් නිලධාරීන්ව දැනුවත් කිරීම. | 2/23/2023 | 196 |
| 4 | ලියාපදිංචි ගරාජ කාර්මිකයන් (මාතර දුම් පරීක්ෂණ මධ්‍යස්ථානය අවට) | 2/26/2023 | 28 |
| | සහ ක්ලීන්කෝ ආයතනයේ කාර්මික නිලධාරීන්ගේ පුහුනු වැඩමුළුව සදහා සම්බන්ධ වීම. | | 53 |
| 5 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 57) | 2023.02.27 | 120 |
| 6 | පිටකොටුව ගුණසිංහපුර පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 47) | 2023.02.28 | 100 |
| 7 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 47) | 2023.03.23 | 102 |
| 8 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 97) | 2023.04.27/28 | 194 |
| 9 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සදහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සදහා පුහුනු කිරීම. (මාතර) | 2023.05.16 සිට 2023.05.19 | 53 |

| | | | |
|---|---|---|---|
| 10 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 59) | 2023.05.30 සිට 2023.05.31 | 118 |
| 11 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරීක්ෂාව. (බස්රථ 51) | 2023.06.28 | 102 |
| 12 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (කුරුණෑගල) | 2023.07.18 සිට 2023.07.21 | 68 |
| 13 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (බදුල්ල) | 2023.07.11 සිට 2023.07.14 | 55 |
| 14 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (ගම්පහ) | 2023.08.15 සිට 2023.08.18 | 55 |
| 15 | රථ වාහන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 2023.08.23/24 | 400 |
| 16 | නිල් අහස සඳහා පිරිසිදු වාතය -කොළඹ | 2023.09.07 | 177 |
| 17 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (මඩකලපුව) | 2023.09.12 සිට 2023.09.15 | 100 |
| 18 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (රත්නපුර) | 2023.09.19 සිට 2023.09.22 | 42 |
| 19 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (කළුතර) | 2023.10.18 සිට 2023.10.20 | 32 |
| 20 | නාවික හමුදා නිලධාරීන් දැනුවත් කිරීම | 2023.10.30 | 211 |
| 21 | දිස්ත්‍රික්ක මට්ටමින් වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා පුහුනු කිරීම. (ගාල්ල) | 2023.11.01 සිට 2023.11.03 | 88 |
| 22 | ලෝක ප්‍රවාහන දිනයට සමගාමීව නිලධාරීන් සහ පැමිණ සිටි පිරිස දැනුවත් කිරීම | 2023.11.10 | 100 |
| 23 | රථ වාහන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 2023.12.13 | 225 |
| **එකතුව** | | | **2780** |









2023 අගොස්තු මස 09,10,11 යන තෙදින තුළ කුරුණෑගල උඹරාපොල මධ්‍ය මහා විද්‍යාලයේ තාක්ෂණික පීඨයේ පැවැත්වූ තාක්ෂනික හා තාක්ෂණ අධ්‍යාපනික ප්‍රදර්ශනය තුළදී ද වාහන වායු විමෝචන වැඩසටහන පිළිබඳ පාසල් ළමුන් හා පැමිණි මහජනතාව දැනුවත් කරන ලදි.









මිනිසුන්ගේ සෞඛ්‍යයට සහ එදිනෙදා ජීවිතයට පිරිසිදු වාතයේ ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සැප්තැම්බර් 7 වැනි දින "නිල් අහස සඳහා පිරිසිදු වාතය පිළිබඳ ජාත්‍යන්තර දිනය" ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව, මෙම වසරේදී "Together for clean air" යන තේමාවෙන් නිල් අහස සඳහා පිරිසිදු වාතය සිව්වන ජාත්‍යන්තර දිනය මෙවර ලෝක ප්‍රජාව විසින් සමරනු ලැබූ අතර මෙහිදී වායු දූෂණය අවම කිරීම සඳහා ආයෝජන වැඩිකිරීම, අදාල පාර්ශව අතර බැඳීම් ශක්තිමත් කිරීම හා වගකීම් බෙදාදීම වැනි අවශ්‍යතාවයන් පිළිබද වැඩි අවධාරණයක් යොමු කරමින් කටයුතු කළේය. 2023 වසරේදී පරිසර අමාත්‍යාංශය හා වාහන වායු විමෝචන භාරකාර අරමුදල විසින් නිල් අහස සඳහා පිරිසිදු වාතය 2023 ජාත්‍යාන්තර දිනය සැමරීම සඳහා ඒකාබද්ධව වැදගත් ක්‍රියාකාරකම් රාශියක් සිදු කළ අතර මෙම වැඩසටහන මාතර, බදුල්ල, කුරුණෑගල, මහනුවර, කොලඹ යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් පවත්වන ලදි.මෙම වැඩසටහන මගින් පාසල් ළමුන් හා ගුරුවරුන් 5000ක් පමණ දැනුවත් කරන ලදි.









ගම්පහ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පැවැත් වූ වසරේ දැවැන්තම අධ්‍යාපනික හා වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන වන "මහපොළ" ප්‍රදර්ශනය තුළදී මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ එක්ව වාහන වායු විමෝචන වැඩසටහනට සම්බන්ධ ප්‍රවර්ධන කුටියක් පවත්වමින් 2023 දෙසැම්බර් මස 12 දින සිට 16 වන දින දක්වා වායු විමෝචන වැඩසටහන පිළිබඳ මහජනතාව දැනුවත් කරන ලදි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ගාල්ල,කුරුණෑගල,මඩකලපුව යන දිස්ත්‍රික්ක වල සංවිධානය කළ ජංගම සේවා වැඩසටහන සමඟ එක්ව මහජනතාව දැනුවත් කළ අතර එම දිස්ත්‍රික්කයන් වල මාර්ගයේ ධාවනය වූ වාහන අහඹු ලෙස පරීක්ෂාවට ලක් කරමින් දුම් පරීක්ෂාව අසමත් වූ වාහන හිමිකරුවන් හට දුම් පරීක්ෂණය අසමත් වීමේ තාක්ෂණික හා තාක්ෂණික නොවන දෝෂ පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් තම වාහනය නිසි ලෙස නඩත්තු කරන අකාරය පිළිබඳවත් දැනුවත් කළේය.

## 2.8 යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ සංවර්ධනය තුළින් වාහන වායු විමෝචන වැඩසටහනේ අපේක්ෂිත සඵලතාව වැඩි දියුණු කිරීම

- ව්‍යාපෘති කාර්යාලයේ නිලධාරීන් සඳහා පරිගණක උපාංග හා මෙහෙයුම් පද්ධතියක් (Server)ක් මිළ දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- වාහන වායු විමෝචන වැඩසටහනේ නිලධාරීන්ගේ ජාතික වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා NVQ – 4 සහතිකය ලබා ගැනීම.
- වාහන වායු විමෝචන ක්‍රියාවලිය නියාමනය, සහතික කිරීම සඳහා ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා ගැනීම..
- වේරහැර මෝටර් රථ ප්‍රවාහන පරිශ්‍රයේ වාහන වායු විමෝචන පරීක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා පෙර සැකසූ බහාලුම් ඒකකයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ නිල වෙබ් පිටුව යාවත්කාලීන කර සකස් කිරීම.
- වාහන වායු විමෝචන දත්ත විශ්ලේෂණය කළ හැකිවන පරිදි නව මෘදුකාංගයක් සකස් කිරීම.

## 2.9 අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබා දීම

- වායු විමෝචන අරමුදල මගින්, එහි ආරම්භයේ සිටම, අවට වායු ගෝලයේ, වායු තත්ත්ව කළමනාකරණය සඳහා, විවිධ ක්‍රියාකාරකම් වෙනුවෙන්, මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අතර, වායු තත්ත්වයේ ගුණාත්මක භාවය මැනීම සඳහා සංසරණ වායු තත්ත්වය මැනීමේ ඒකක ලබාදීම හා වායු දූෂක, වායු දූෂණ ප්‍රභව, වායු දූෂණයේ බලපෑම් හා ඒවා අඩු කරගන්නා ක්‍රම හඳුනා ගැනීමට විවිධ පරීක්ෂණ සඳහා ප්‍රතිපාදන ලබා දීම ප්‍රමුඛ ලෙස දැක්විය හැක.

- සංසරණ වායු තත්ත්වයන් මැනීමේ කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇති ස්ථිර වායු තත්ත්ව මැනීමේ ඒකක දෙක සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට ලබා දී ඇති ජංගම වායු තත්ත්ව මැනීමේ ඒකකය වෙනුවෙන් මෙහෙයුම් නඩත්තු සහ සේවා කටයුතු සිදු කරමින් ජාතික ඒකාබද්ධ වායු තත්ත්ව නිරීක්ෂණ ජාලයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත .

| ආයතනය | ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය | 3,437,358.00 |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 9,000,000.00 |





- ලංකාවට ගැලපෙන දවන චක්‍ර හඳුනා ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය වෙත රුපියල් 920,000.00ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

## 2.10 පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම

1. දේශගුණ විපර්යාස සඳහා එක්සත් ජාතීන්ගේ සම්මුතියට (UNFCC) අනුව පැරිස් ගිවිසුමේ පාර්ශව රාජ්‍යක් ලෙස ශ්‍රී ලංකාව විසින් ජාතික වශයෙන් තීරණය කල දායකත්වය (NDC) සකස් කිරීමේදී ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල NDC සකස් කිරීම සඳහා සක්‍රිය ලෙස දායක වීම.

2. 2050 Carbon Net Zero Road Map හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය නියෝජනය කරමින් පරිසර අමාත්‍යාංශය වෙත දායකත්වය ලබ දීම.

3. “Clean Air 2025” ක්‍රියාකාරී සැලැස්මෙහි වාහන වායු විමෝචන භාරකාර අරමුදල සඳහා පවරන ලද ක්‍රියාකාරකම් සිදු කිරීම හා “Clean Air 2025” ක්‍රියාකාරී සැලැස්ම සඳහා වූ මෙහෙයුම් කමිටු සඳහා දායකත්වය ලබා දීම.

4. දැනට භාවිතා කරනු ලබන ඉන්ධන වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම හා පරිසර හිතකාමී විකල්ප ඉන්ධන ප්‍රබව ( bio-fuel, CNG, LNG ) හඳුන්වාදීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා දායක වීම.

5. අමාත්‍යමණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ කාබන් හුවමාරු යාන්ත්‍රනය (Joint carbon crediting mechanism )සඳහා දායකත්වය සැපයීම .

6. සූර්යය බලශක්ති අධිකාරිය විසින් සකස් කරනු ලබන වාහන ඉන්ධන කාර්යක්ෂමතා ලේබනය )fuel economy labeling system සකසි (මට දායකත්වය දැක්වීම.

7. සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අහඹු වාහන සාම්පල් පරීක්ෂණ ක්‍රමවේදය දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් විසිරි ඇති පරිසර නිලදාරීන් සමග එක්ව ක්‍රියාත්මක කිරීම.

8. දුම් පරීක්ෂණ උපකරණ සේවා කිරීම සඳහා සේවා ආයතන සමග නිසි ගිවිසුමක් ඇති කර ගැනීම තුලින් ඒකාකාරී වන පරිදි උපකරණ යාවත්කාලින වීම තහවුරු කිරීම .


9. දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන වන ලාෆ් ඉකෝ ශ්‍රී පුද්ගලික සමාගම සහ ක්ලීන්කෝ ලංකා පුද්ගලික් සමාගම අතර පැවැති ගිවිසුම යාවත්කාලීන කර කෙටුම්පත් කිරීම.

03- පරිච්ඡේදය

## 3.1 2023 වර්ෂයේ වාහන ගණත්වය


2023 වර්ෂයේ දුම් පරීක්ෂාවන් සිදු කල වාහන සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | වාහන පන්තිය | පරීක්ෂණ ප්‍රමාණය |
|---|---|---|
| 1 | MOTOR CYCLE | 3,340,980 |
| 2 | MOTOR TRICYCLE | 1,072,416 |
| 3 | MOTOR CAR | 590,543 |
| 4 | DUAL PURPOSE VEHICLE/VAN | 421,768 |
| 5 | MOTOR LORRY | 231,593 |
| 6 | MOTOR COACH | 60,670 |
| 7 | BUS | 275 |
| 8 | PRIME MOVER | 1,639 |
| 9 | LAND VEHICLE | 137 |
| | Total | 5,720,021 |





2023 වර්ෂයේ වාහන ගණත්වය


## 3.2 2023 වර්ෂයේ දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන මගින් සිදු කළ දුම් පරීක්ෂණ වල සාරාංශය






| අනු අංකය | වාහන පන්තිය | පළමු පරීක්ෂණය | | |
|---|---|---|---|---|
| | | පරීක්ෂණ ප්‍රමාණය | සමත් ප්‍රමාණය | අසමත් ප්‍රමාණය |
| 1 | MOTOR CYCLE | 3,340,980 | 2,578,243 | 762,737 |
| 2 | MOTOR TRICYCLE | 1,072,416 | 779,373 | 293,043 |
| 3 | MOTOR CAR | 590,543 | 541,600 | 48,943 |
| 4 | DUAL PURPOSE VEHICLE/VAN | 421,768 | 376,985 | 44,783 |
| 5 | MOTOR LORRY | 231,593 | 203,664 | 27,929 |
| 6 | MOTOR COACH | 60,670 | 53,527 | 7,143 |
| 7 | BUS | 275 | 244 | 31 |
| 8 | PRIME MOVER | 1,639 | 1,490 | 149 |
| 9 | LAND VEHICLE | 137 | 116 | 21 |
| | Total | 5,720,021 | 4,535,242 | 1,184,779 |


<u>වාහන පන්තිය අනුව සමත් අසමත් ප්‍රමාණයන් සහ ප්‍රතිශතයන්</u>

















BUS
250
200
150
100
50
-
244
89%
31
11%
Pass
Fail


MOTOR COACH
60,000
50,000
40,000
30,000
20,000
10,000
-
53,527
88%
7,143
12%
Pass
Fail


MOTOR LORRY
250,000
200,000
150,000
100,000
50,000
-
203,664
88%
27,929
12%
Pass
Fail

## 04- පරිච්ඡේදය

### 4.1 2023 වර්ෂයේ දුම් පරීක්ෂණ මගින් 10%ක මුදල් ලැබීම්

| මාසය | ලාෆ් ඉකෝ ශ්‍රී පුද්.සමාගම | ක්ලීන්කෝ ලංකා පුද්. සමාගම | මුලු මුදල |
|---|---|---|---|
| **ජනවාරි** | 15,784,072.29 | 12,859,865.40 | 28,643,937.69 |
| **පෙබරවාරි** | 13,778,431.01 | 11,502,531.28 | 25,280,962.29 |
| **මාර්තු** | 16,285,517.49 | 13,325,197.06 | 29,610,714.55 |
| **අප්‍රේල්** | 12,784,156.84 | 10,617,271.36 | 23,401,428.20 |
| **මැයි** | 15,462,184.33 | 12,715,639.38 | 28,177,823.71 |
| **ජුනි** | 15,144,754.39 | 12,523,255.32 | 27,668,009.71 |
| **ජුලි** | 16,106,926.78 | 13,358,116.60 | 29,465,043.38 |
| **අගෝස්තු** | 15,895,697.08 | 13,329,148.70 | 29,224,845.78 |
| **සැප්තැම්බර්** | 14,421,036.94 | 11,860,909.68 | 26,281,946.62 |
| **ඔක්තෝම්බර්** | 16,624,257.92 | 13,732,186.72 | 30,356,444.64 |
| **නොවැම්බර්** | 15,740,722.94 | 13,051,169.64 | 28,791,892.58 |
| **දෙසැම්බර්** | 16,109,030.16 | 13,457,808.62 | 29,566,838.78 |
| **මුලු එකතුව රු.** | ***184,136,788.17*** | ***152,333,099.76*** | ***336,469,887.93*** |

## 4.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| **වත්කම්** | **31.12.2023** | **31.12.2022** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | **(රු.)** | **(රු.)** |
| දේපල, යන්ත්‍ර හා උපකරණ | **1,976,339** | **26,048,151** |
| **ජංගම වත්කම්** | | |
| පෙරගෙවුම් | 1,259,351 | 1,510,684 |
| අදායම් ණයගැතියන් | 3,778,239 | 4,316,076 |
| ස්ථාවර තැම්පතු | 550,969,863 | 328,263,698 |
| මුදල් - ඉතිරිකිරීම් | 60,135,543 | 121,677,172 |
| මුදල් - ජංගම ගිණුම් | (9,626,515) | (1,737,124) |
| **මුලු ජංගම වත්කම්** | **606,516,481** | **454,030,506** |
| **මුලු වත්කම්** | **608,492,820** | **480,078,657** |
| **ප්‍රාග්ධනය හා වගකීම්** | | |
| සමුච්චිත අරමුදල | 606,029,628 | 476,901,733 |
| **මුලු ශුද්ධ වත්කම්/ප්‍රාග්ධනය** | **606,029,628** | **476,901,733** |
| **වගකීම්** | | |
| විවිධ ණයගැතියන් | 2,463,192 | 3,176,924 |
| **මුලු වගකීම්** | **2,463,192** | **3,176,924** |
| **ශුද්ධ වත්කම්** | **608,492,820** | **480,078,657** |

## 4.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | 2023.12.31 (රු.) | 2022.12.31 (රු.) |
|---|---|---|
| **මෙහයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය** | | |
| **ජනිත වූ මුදල් ප්‍රවාහයන්:** | | |
| **ලැබීම්:** | | |
| *ලාෆ් සහ ක්ලීන්කෝ ආයතන වලින් ලද අදායම්* | 337,007,708 | 272,983,617 |
| *අනෙකුත් ලැබීම්* | 100,200 | 33,400 |
| *පෙරගෙවුම් පියවීම්* | - | 4,201,903 |
| *3% දඩ මුදල් රැස්කිරීම්* | - | 36,970 |
| **ජනිතවූ මුලු මුදල් ප්‍රවාහය** | **337,107,708** | **277,255,890** |
| **මුදල් වැයකිරීම්:** | | |
| *පරිපාලනමය හා අනෙකුත් වියදම්* | (46,268,286) | (45,485,165) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකමෙන් ලද ශුදධ මුදල් ප්‍රවාහය** | **290,839,622** | **231,770,725** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය** | | |
| **ජනිත වූ මුදල් ප්‍රවාහයන්:** | | |
| *ඉතිරිකිරීම් පොලී ආදයම්* | 3,014,798 | 4,470,721 |
| *කල්පිරුනු ස්ථාවර තැම්පතු* | 1,000,000,000 | 800,000,000 |
| *කල්පිරුනු ස්ථාවර තැම්පතු පොලී ආදායම්* | 78,670,493 | 25,165,069 |
| **ජනිතවූ මුලු මුදල් ප්‍රවාහය** | **1,081,685,291** | **829,635,790** |
| **මුදල් වැයකිරීම්:** | | |
| *ස්ථාවර වත්කම් මිලදී ගැනීම්* | (1,955,933) | (729,575) |
| *ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා පෙරගෙවුම්* | - | (251,333) |
| *ස්ථාවර තැම්පතුහි ආයෝජනය කිරීම්* | (1,240,000,000) | (800,000,000) |
| **මුලු වැයකිරීම්** | **(1,241,955,933)** | **(800,980,908)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්හි ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(160,270,642)** | **28,654,882** |
| **මූල්‍යමය කටයුතු මුදල් ප්‍රවාහයන්** | | |
| **මුදල් වැයකිරීම්:** | | |
| *ඒකාබද්ධ අරමුදල්ට මුදල් බැරකිරීම්* | (200,000,000) | (400,000,000) |
| **මුලු වැයකිරීම්** | **(200,000,000)** | **(400,000,000)** |
| **මූල්‍යමය කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(200,000,000)** | **(400,000,000)** |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ ශුද්ධ අඩුවීම්** | **(69,431,020)** | **(139,574,393)** |
| **වර්ෂ ආරාම්භක මුදල් ශේෂය 01.01.2023** | **119,940,048** | **259,514,441** |
| **වර්ෂ අවසාන මුදල් ශේෂය 31.12.2023** | **50,509,028** | **119,940,048** |

## 4.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| වත්කම් කාණ්ඩය | පිරිවැය රු. | එකතුවීම් රු. | ඉවත්කිරීම් රු. | 2023.12.31 ඉතිරිය රු. | ක්ෂය % | සමුච්චිත ක්ෂය 2022.12.31 | එකතු වීම් රු. | ඉවත්වීම් රු. | සමුච්චිත ක්ෂය 2023.12.31 | ශුද්ධ අගය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රථ වාහන | 14,723,751 | - | 1,664,614 | 13,058,637 | 20% | 14,723,250 | | 1,664,614 | 13,058,636 | 1 |
| ගෘහභාණ්ඩ | 535,807 | 2,124,265 | 632,354 | 2,027,718 | 20% | 449,292 | 221,744 | | 671,035 | 1,356,683 |
| පරිගණක උපාංග | 2,123,650 | - | - | 2,123,650 | 25% | 1,542,255 | 146,250 | | 1,688,505 | 435,145 |
| දුම් පරීක්ෂණ උපකරණ | 214,748,480 | - | 47,247,000 | 167,501,480 | 20% | 189,546,050 | 19,248,012 | 41,292,584 | 167,501,479 | 1 |
| අනෙකුත් උපකරණ | 3,257,218 | 83,000 | - | 3,340,218 | 25% | 3,079,408 | 76,301 | | 3,155,709 | 184,509 |
| **Total** | **234,444,892** | **2,207,265** | **49,509,1068** | **188,051,703** | | **209,340,255** | **19,692,307** | **42,957,198** | **186,075,364** | **1,976,339** |

## 4.5 ස්ථාවර තැන්පතු සහ පොලී ආදායම්

| ආයෝජිත දිනය | පොලී % | ගිණුම් අංකය | ආයෝජිත මුදල රු. | කල්පිරෙනු ලබන දිනය | පොලී ආදායම 2022 රු.. | පොලී ආදායම 2023 රු.. | | රඳවුම් බදු රු. | මුදලින් ලද ශුද්ධ පොලී ආදයම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මුදලින් | මුදලින් | ලැබිය යුතු | | |
| 2022.08.23 | 26.25% | 119600100130659 | 300,000,000 | 2023.02.23 | 28,263,699 | 11,434,931 | - | - | 39,698,630 |
| 2023.04.26 | 21.00% | 1196001000146027 | 500,000,000 | 2023.07.26 | - | 26,178,082 | - | 1,308,904 | 24,869,178 |
| 2023.07.26 | 9.75% | 1196001000151163 | 200,000,000 | 2023.08.08 | - | 427,397 | - | 21,370 | 406,027 |
| 2023.07.31 | 13.00% | 1196001000151190 | 440,000,000 | 2023.10.31 | - | 14,417,534 | - | 720,877 | 13,696,658 |
| 2023.10.31 | 13.00% | 1196001000151190 | 440,000,000 | 2024.01.31 | - | - | 9,716,164 | - | - |
| 2023.11.01 | 13.00% | | 100,000,000 | 2024.02.01 | - | - | 2,172,604 | - | - |
| **එකතුව රු.** | | | | | **28,263,699** | **52,457,944** | **11,888,768** | **2,051,151** | **78,670,493** |

# 05- පරිච්ඡේදය

## 5.1හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| **ඉලක්කය/ අරමුණ** | **ඉලක්කය සපුරා ගැනීම සඳහා වාහන වායු විමෝචන වැඩසටහන මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්** | **ජයග්‍රහණ දර්ශක** | **මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය %** | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 | 50-74 | 75-100 |
| **3.9 -** 2030 වන විට රසායනික, වාතය,ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගී තත්ත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | වාහන වලින් පිටවන විෂ දුම් පාලනය කිරීම සඳහා රථ වාහනවල වායු විමෝචන පරක්ෂාවන් සිදු කිරීම | වාහන වලින් විෂ දුම් නිකුත් වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලිවල අඩුවැඩි වීම | | | ✓ |
| **11.6 -** 2030 වන විට වාතය ගුණාත්මක භාවය කළමනාකරණය තුලින් අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල වන වාහන සංඛ්‍යාව වැඩි කිරීම මගින් අවට වාතයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම | | | | ✓ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

| **ඉලක්කය/ අරමුණ** | **ඉලක්කය සපුරා ගැනීමට බාධා වන කරුණු** |
|---|---|
| **3.9 -** 2030 වන විට රසායනික, වාතය,ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගී තත්ත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | වාහන දුම් පරීක්ෂාව සිදු කිරීම නොව ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ අරමුණින් යුතුව ව්‍යාජ සැකසුම් සහිතව දුම් පරීක්ෂාව සඳහා වාහන යොමු කිරීම.<br><br>පොදු මහජනතාව මෙම ක්ෂේත්‍රයන්හි හඳුනා ගනු ලබන ගැටළු. ඒ සඳහා වගකීම දරණ ආයතන වෙත පැමිණිලි කිරීමට මැලි වීම |
| **11.6 -** 2030 වන විට වාතය ගුණාත්මක භාවය කළමනාකරණය තුළින් අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි වාහනය නඩත්තු කිරීම පිළිබඳ අවබෝධය අඩු වීම. |

# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වාහන වායු විමෝචන භාරකාර අරමුදල කාර්යය සාධන වාර්තාව 2023

**සකස් කළේ :-.....................................**

**පරීක්ෂා කළේ :-.....................................**

**2023 වර්ෂයේ කාර්යය සාධන වාර්තාව ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරමි.**

**....................................................**
**අධ්‍යක්ෂ**
**වාහන වායු විමෝචන වැඩසටහන**

**.......................................................**
**අධ්‍යක්ෂ ජනරාල්**
**වාහන වායු විමෝචන වැඩසටහන**